# මාසික
# විවරණිකාව

**2010 නොවැම්බර්**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

60 වැනි වෙළුම 11 වැනි කලාපය

**2010 නොවැම්බර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 - 06 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2010 නොවැම්බර් | ..... | 07 |
| 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 නොවැම්බර් | ..... | 07 |
| 2. විදේශ විනිමය රෙගුලාසි තවදුරටත් ලිහිල් කිරීම | ..... | 08 - 11 |
| 3. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) | ..... | 12 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2010 නොවැම්බර්

**රාජ්‍ය මූල්‍ය අංශය**

- කුකුල් මස් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 150 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. එබැවින් කිලෝග්‍රෑමයකට රුපියල් 50 ක් තීරු බදු ලෙස යෙදේ.

- බිත්තර ආනයනය සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 100 ක සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී.

- පෙට්‍රල් (සං.ව. සංකේතය 2710.11.20), ගල් අඟුරු (සංකේත අංක 2701.11, 2701.12 සහ 2701.19) සහ බිටුමන් (ශීර්ෂ 27.14 සහ සංකේත 2713.20) ආනයනය හෝ සැපයීම, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- පෙට්‍රල් ආනයනය (සංකේත අංක 2710. 11.20) සඳහා ලබා දී තිබූ ලීටරයකට රුපියල් 35 ක් වූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම, ලීටරයකට රුපියල් 20 දක්වා අඩුකරන ලදී.

- ඩීසල් ආනයනය (සංකේත අංක 2710. 19.40) සඳහා ලබා දී තිබූ ලීටරයකට රුපියල් 15 ක් වූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම, ලීටරයකට රුපියල් 11 ක් දක්වා අඩු කරන ලදී.

- ලොතරැයි සහ දුරකථන කාඩ්පත් ආනයනය සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 600 ක සෙස් බද්දක් පනවන ලදී.

- සංයෝජිත වර්ගීකරණ සංකේත 30.01, 30.02, 30.03, 30.04, සහ 30.06 යටතට ගැනෙන ඖෂධ නිෂ්පාදන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

- වාහන ආනයනය සඳහා වන තීරු බදු සහ නිෂ්පාදන බදු සංශෝධනය කරන ලදී.

- විදුලි යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා වන තීරු බදු සංශෝධනය කරන ලදී.

- විදුලි සංදේශ සේවාවන් සඳහා පනවා තිබූ පරිසර සංරක්ෂණ බද්ද ඉවත් කරන ලදී.

- සමාජ වගකීම බද්ද ඉවත් කරන ලදී.

- මධ්‍යසාර නිෂ්පාදනය සඳහා බලපවත්වන සුරා බදු ඉහළ නංවන ලදී.

- මධ්‍යසාර නිෂ්පාදනය හා විකිණීම සම්බන්ධයෙන් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුව හා ආරක්ෂක තැන්පතුව සංශෝධනය කරන ලදී.

- දුම්වැටි සඳහා පනවා තිබූ නිෂ්පාදන බද්ද ඉහළ නංවන ලදී.

**ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයෙන් ලද ණය**

ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය අතර 2010 නොවැම්බර් 08 වැනි දින ගිවිසුම් තුනකට අත්සන් තබන ලද අතර, මෙම ණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ණය මුදල මත සියයට 0.75 ක සේවා ගාස්තුවක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. අවුරුදු 10 ක සහන කාලයකට යටත්ව අවුරුදු 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

(1) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා වි.ගැ.හි. මිලියන 37.8 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.65 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

(2) උතුරු නැගෙනහිර දේශීය සේවා ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා වි.ගැ.හි. මිලියන 33.0 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.80 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

(3) සංචාරක ව්‍යාපාරයේ ස්ථිරසාර සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා වි.ගැ.හි. මිලියන 11.6 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.04 ක) ණය මුදල සඳහා වූ ගිවිසුම

**ජපන් රජයෙන් ලද ප්‍රදාන**

නැගෙනහිර පළාතේ පාලම් 5 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 නොවැම්බර් 25 වැනි දින ශ්‍රී ලංකා රජය හා ජපන් රජය අතර, ජපන් යෙන් බිලියන 1.217 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.62 ක) ප්‍රදානයන් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**සරණාගතයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයෙන් ලද ප්‍රදාන**

ගැටුම්වලින් අවතැන් වූවන් නැවත පදිංචි කරවීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 නොවැම්බර් 16 වැනි දින ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය අතර එ.ජ.ඩොලර් මිලියන 2.148 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 239.89 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**චීන සමූහාණ්ඩුවෙන් ලද ප්‍රදාන**

ශ්‍රී ලංකා රජය සහ චීන සමූහාණ්ඩුව අතර සහයෝගිතාව තවදුරටත් ගොඩනැංවීම සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව වර්ධනය කිරීමේ දැක්මකින් යුතුව 2010 නොවැම්බර් මස 18 වැනි දින දෙරට අතර චීන යුආන් මිලියන 50 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 840.92 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**කොරියානු අපනයන - ආනයන බැංකුවෙන් ලද ණය**

හැටන්-නුවරඑළිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා රජය සහ කොරියානු අපනයන - ආනයන බැංකුව අතර, එ.ජ.ඩොලර් මිලියන 40 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 4.47 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.1 ක පොලී අනුපාතිකයක් අදාළ වේ. අවුරුදු 10 ක සහන කාලයකට යටත්ව අවුරුදු 40 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**2 වන කොටස**

# පුවත්පත් නිවේදන

**2010 නොවැම්බර්**

## 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 නොවැම්බර්

*මෑතකාලීන දේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා සතුටුදායක තත්ත්වයක පවතී. වසරේ පළමු කාර්තු දෙක තුළ මූර්ත වශයෙන් ආර්ථික කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇත. විදේශ වෙළෙඳාම යථා තත්ත්වයට පත් වී ඇති අතර, වසරේ ප්‍රථම කාර්තු තුන තුළ අපනයන ඉපැයුම් හි වර්ධනයක් වාර්තා කර ඇත. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ද තවදුරටත් ස්ථායී මට්ටක පවතී. මේ අතර, රටෙහි ජාත්‍යන්තර සංචිත තවදුරටත් ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පවතින අතර, විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මධ්‍යයේ වුවද, ඉදිරි කාලපරිච්ඡේදය තුළ ද සංචිත මෙලෙස ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

ණය හා සම්බන්ධ වාතාවරණය යහපත් අතට පත්වීමත් සමග ණය සඳහා පවතින ඉල්ලුම වර්ධනය වී ඇත. පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය ප්‍රමාණය මෙම වසර තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇති අතර, සැප්තැම්බර් මාසය වන විට වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.5 දක්වා ඉහළ නගින ලදී. කෙසේ නමුත්, පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය ඉලක්කගත මට්ටම තුළ පවතින අතර, සැප්තැම්බර් මාසයෙන් අවසන් වන කාර්තුව තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එය සියයට 13 - 14 අතර පැවතුණි.

මෙම වසරේ ඔක්තෝබර් මාසය වන විට, කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව (පදනම් වර්ෂය = 2002) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය සියයට 6.6 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 5.4 ක් විය. ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් සැපයුම් අංශය තුළ ඇති වූ යම් හිඟතාවයන් හේතුවෙන් තිරිඟු සහ තිරිඟු ආශ්‍රිත නිෂ්පාදන, පොල් සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ කිහිපයක මිල ගණන් ඉහළයාම මෑත මාස තුළ උද්ධමනය ඉහළ යාමට මූලික වශයෙන් හේතු විය. කෙසේ නමුත් වාර්ෂික සාමාන්‍ය පදනම මත වසර අග වන විට උද්ධමනය මැදි තනි අගයක පවතී යැයි අපේක්ෂා කෙරේ.

මෙම වර්ධනයන් සියල්ල සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2010 නොවැම්බර් මස 15 වන දින පැවති රැස්වීමේ දී, මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව වත්මන් මට්ටමේම පවත්වා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැණුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.25 ක් හා සියයට 9.00 ක් ලෙස පවතී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2010 දෙසැම්බර් 14 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 2. විදේශ විනිමය රෙගුලාසි තවදුරටත් ලිහිල් කිරීම

*අතිගරු ජනාධිපතිතුමා විසින් 2010.11.22 දින ප්‍රකාශයට පත්කරන ලද 2011 වර්ෂය සඳහා වූ අයවැය අනුව, විදේශ විනිමය ගනුදෙනු පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය පාලනයන් සරල කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.*

ඒ අනුව, ශ්‍රී ලාංකිකයන් විසින් විදේශයන්හි සිදුකරන ආයෝජන, නේවාසික සමාගම් විසින් සිදුකරන විදේශීය ණය ගැනීම් සහ අනේවාසිකයන් විසින් දේශීය වෙළෙඳපොළ තුළ සිදුකරන ආයෝජන හා සම්බන්ධ විදේශ විනිමය රෙගුලාසි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලිහිල් කර ඇත. මෙම ප්‍රතිපත්තීන් 2010 ජනවාරි මාසයේ දී "2010 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති පෙර දැක්ම" මගින් ද නිවේදනය කර ඇත. තවද, සංචාරක සහ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයන් ද ඇතුලත්ව ඉතා වැදගත් අංශ ගණනාවක් සඳහා නව විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හඳුන්වා දී ඇත. මෙම ප්‍රතිපත්ති අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට මෙම ප්‍රතිපත්තිවල පළමු කාණ්ඩය 2010 නොවැම්බර් මස 22 දින සිට සහ අනෙකුත් ප්‍රතිපත්ති 2011 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2010 නොවැම්බර් මස 22 වන දින සිට ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති මාලාව පහත දක්වා ඇත.

1. **දේශීය සමාගම් විසින් නිකුත් කරනු ලබන රුපියල්වලින් නියම කරන ලද ණයකරවල ආයෝජනය කිරීම සඳහා විදේශිකයන්ට අවසර ලබාදීම.**

   සංස්ථාපිත බැඳුම්කර වෙළෙඳපොළ මගින් පෞද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලට ආධාර වන දිගුකාලීන අරමුදල් ඉහළ නැංවීමට විකල්ප මාර්ග යක් සපයන අතරම අරමුදල් අවශ්‍යතා සඳහා බැංකු පද්ධතිය මතම අධික ලෙස විශ්වාසය තැබීම අඩු කිරීමට ඉඩ හරිනු ලැබේ. මෙම වාසිදායක තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සහ ආයෝජන පදනම පුළුල් කිරීමේ මෙන්ම ද්විතීය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවය වැඩිකිරීමේ අරමුණින් යුතුව විදේශිකයන්ට රුපියල්වලින් නියම කරන ලද ණයකරවල ආයෝජනය කිරීමට අවසර ලබාදීමට තීරණය කර ඇත.

   වර්ධනය වූ සාර්ව ආර්ථික තත්ත්වයන්, විශේෂයෙන්ම උද්ධමනයේ අඩුවීම, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ වර්ධනයන් සහ පොලී අනුපාත අඩු වීම ශ්‍රී ලංකාවේ බැඳුම්කර වෙළෙඳපොළ ශක්තිමත් කිරීමට ඉවහල් වනු ඇත. එසේම බැඳුම්කර වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජකයන්ගේ සහභාගිත්වය ඉහළයාම තුළින් පොලී අනුපාත තවදුරටත් අඩුවීමටත්, දේශීය වෙළෙඳපොළ තුළ ස්ථාවරත්වය ඇති කිරීමටත් දායකත්වය ලබාදෙනු ඇති අතරම, ආර්ථිකයේ මූල්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ඇත.

2. **විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා සමාගම්වලට අනුමැතිය ලබාදීම කඩිනම් කිරීම**

   ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ඉහළ වර්ධන වේගය පවත්වාගෙන යාමට ආයෝජන වැඩිකර ගත යුතු අතර ඒ සඳහා සාපේක්ෂ වශයෙන් අඩු පිරිවැයක් යටතේ ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, විවිධාකාරයේ ව්‍යාපාර කටයුතුවල නිරත සමාගම්වලට එම සමාගම් විදේශ විනිමය උපයන්නන් යන කරුණු නොසලකා හරිමින් විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා අවසර ප්‍රදානය කරනු ඇත. මෙම පියවර, දේශීය වෙළෙඳපොළ තුළ අරමුදල් සඳහා වන පීඩනය සමනය කරන අතර රටේ ආර්ථික කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා පවතින අවස්ථා ද වැඩි කරයි.

2. **විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා සමාගම්වලට අනුමැතිය ලබාදීම කඩිනම් කිරීම**

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ඉහළ වර්ධන වේගය පවත්වාගෙන යාමට ආයෝජන වැඩිකර ගත යුතු අතර ඒ සඳහා සාපේක්ෂ වශයෙන් අඩු පිරිවැයක් යටතේ ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, විවිධාකාරයේ ව්‍යාපාර කටයුතුවල නිරත සමාගම්වලට එම සමාගම් විදේශ විනිමය උපයන්නන් යන කරුණ නොසලකා හරිමින් විදේශ මූලාශ්‍රවලින් ණය ලබාගැනීම සඳහා අවසර ප්‍රදානය කරනු ඇත. මෙම පියවර, දේශීය වෙළෙඳපොළ තුළ අරමුදල් සඳහා වන පීඩනය සමනය කරන අතර රටේ ආර්ථික කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා පවතින අවස්ථා ද වැඩිකරයි.

3. **විදේශීය සමාගම්වලට ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීම සඳහා අවසර ලබාදීම**

බොහෝ විදේශීය සමාගම් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන පිහිටුවීමට විශාල උනන්දුවක් දක්වන බව පෙනේ. එසේම, විදේශීය සමාගම් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීම විනිමය පාලන පනත යටතේ නිකුත් කළ රෙගුලාසිවලට අනුකූල විය යුතු බව සමාගම් පනතේ දක්වා ඇත. කෙසේ වුවත් වර්තමානයේ දී විදේශීය සමාගම් විසින් ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ගෙන ඒම සඳහා මෙන්ම අතිරික්ත අරමුදල් නැවත ඔවුන්ගේ රටවලට ගෙන යාම සහ වෙනත් ප්‍රතිමුඛ ගෙවීම් නියාමනය කිරීම සඳහාත් පැහැදිලි සහ පහසු ක්‍රියාදාමයක් නොමැත.

ඒ අනුව, රට තුළ විදේශ සෘජු ආයෝජනයන්ට තවදුරටත් පහසුකම් සැලසීම පිණිස මෙම අරමුණ සඳහා විවෘත කළයුතු බැංකු ගිණුම් ආවරණය කරමින් බලය ලත් වෙළෙඳුන් සඳහා අවශ්‍ය විධි විධානයන් නිකුත් කර ඇති අතරම, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීමේ දී විදේශීය සමාගම් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය දක්වමින් අවශ්‍ය ගැසට් නිවේදනය ද නිකුත් කර ඇත.

4. **සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීම සඳහා අවසර ලබාදීම**

සාචාරකයින්ගේ පැමිණීම වැඩිවීමත් සමඟ සංචාරක අංශය සැලකිය යුතු පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපාරික කටයුතු සඳහා ලංකාවට පැමිණෙන අනේවාසික විජාතිකයන්ගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට තවදුරටත් පහසුකම් සැලසීමට බලාපොරොත්තු වේ.

ඉහත සඳහන් කරන ලද අනේවාසිකයන්ට ඔවුන් ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය තුළ ඔවුන්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂිතව සිදු කිරීමටත්, රටේ සංචාරක කර්මාන්තය හා ව්‍යාපාරික ක්‍රියාකාරකම් පුළුල් කිරීමට දායකත්වය ලබාදීම සඳහාත් මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මගින් පහසුකම් සලසනු ඇත.

5. **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට අවසර ලබාදීම**

ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය, වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම සඳහා කේන්ද්‍රස්ථානයක් කිරීම ප්‍රතිපත්තිමය අරමුණට පහසුකම් සැළසීමේ අරමුණින් යුතුව මැණික් සහ/හෝ ආනයනකරුවන්හට ද මැණික් සහ/හෝ ස්වර්ණාභරණ අපනයන කරන වක්‍ර සහ සෘජු අපනයනකරුවන්හට ලබා දී ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පහසුකම් ලබාදීමට තීරණය කර ඇත.

මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ඉපැයුම් අනුමත විදේශ ව්‍යවහාර මුදල්වලින් රඳවා තබා ගැනීමටත්, විනිමය පාඩුවලින් තොරව කපන ලද සහ ඔප මට්ටම් කරන ලද හෝ රළු මැණික් ගල් සහ අනෙකුත් අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන වියදම් වෙනුවෙන් මෙවැනි අරමුදල් යොදා ගැනීමටත් ඉඩ හැරීම තුළින් ඔවුන්ගේ ගනුදෙනු වඩාත් සුමටව සිදු කිරීමට මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම මගින් පහසුකම් සලසනු ඇත. තවද, විදේශයන්ගෙන් රළු මැණික් ගල් සහ අනෙකුත් අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් ස්වරූපයෙන් මුදල් ආපසු ලබා ගැනීමට ඔවුනට අවසර ලබාදෙනු ඇත.

6. **ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය දූත කාර්යාල, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සහ පවුලේ සාමාජිකයින් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් සමහර බැංකු කටයුතු සඳහා අවසර ලබාදීම.**

ශ්‍රී ලංකාව විදේශීය ජාතිකයින් සමග සුහද ද්විපාර්ශවීය සහ බහුපාර්ශවීය සබඳතා පවත්වාගෙන යන අතර, මෙම සබඳතා තවදුරටත් පුළුල් වෙමින් පවතී. වර්තමානයේ දී, විනිමය පාලන අරමුණු සඳහා විදේශ රාජ්‍ය දූත කාර්යාල එනම් තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් කාර්යාල, යුරෝපීය සංගමයේ හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ස්ථිර දූත මෙහෙයුම්, අනේවාසිකයන් ලෙස සළකනු ලබන අතර විදේශ ව්‍යවහාර මුදලින් ඇතැම් බැංකු ගනුදෙනුවල නිරත වීමේ දී ඔවුන් විසින් විශේෂ අවසරයක් ලබා ගැනීමට සිදුවීම රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාවට සැලකිය යුතු අපහසුතාවයක් ඇති කරයි. රාජ්‍ය දූත කාර්යාලවල සිටින කාර්ය මණ්ඩලයට නිදහසේ බැංකු සමග විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු කිරීමට මෙම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මගින් පහසුකම් සැලසේ යැයි අපේක්ෂා කෙරේ.

7. **භාණ්ඩ ආනයනයන් මත කෙරෙන පූර්ව ගෙවීම ඇ.එ.ජ.ඩොලර් 10,000/- සිට ඇ.එ.ජ.ඩොලර් 50,000/- දක්වා වැඩි කිරීම.**

වෙළෙඳ ගනුදෙනුවල ප්‍රසාරණයත්, ඒවායේ වටිනාකම වැඩිවීමත් හේතුවෙන්, භාණ්ඩ ආනයනය මත කෙරෙන පූර්ව ගෙවීම් සඳහා අවසර ලබාදුන් මුදල වැඩි කිරීම දැන් අවශ්‍ය වී ඇත. ඒ අනුව, භාණ්ඩ ආනයනය මත කෙරෙන පූර්ව ගෙවීමේ සීමාව ඇ.එ.ජ.ඩොලර් 10,000 සිට ඇ.එ.ජ.ඩොලර් 50,000 දක්වා වැඩි කරන ලදී. මෙම ලිහිල්කරණය දේශීය වෙළෙඳපොළෙහි විදේශීය වෙළෙඳ කටයුතු සහ අන්තරාල වෙළෙඳ කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කරනු ඇත.

**2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති මාලාව**

8. **ශ්‍රී ලංකාවේ නේවාසික තනි පුද්ගලයන්, සංස්ථාගත සහ සංස්ථාගත නොකළ ආයතනවලට විදේශීය සමාගම්වල කොටස්වල ආයෝජනය කිරීමට අවසර ලබාදීම.**

ශක්තිමත් විදේශ සංචිත සහිත රටවල් විසින් තවදුරටත් විදේශ සංචිතයන්හි දිගුකාලීන ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා එම රටවල නේවාසිකයන්ට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ගනුදෙනු කිරීමට හැකිවන පරිදි ක්‍රමක්‍රමයෙන් ප්‍රාග්ධන ගිණුම ලිහිල් කර ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළවලට ඇතුළත් වීම, දේශීය ආයතනවල යහපාලන ක්‍රියාමාර්ග යන් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීමට හේතුවනු ඇතැ බවට ද විශ්වාස කෙරේ. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත යහපත් මට්ටමකට වර්ධනය වී තිබෙන හෙයින් හා එය තවදුරටත් වර්ධනය වෙතැයි අපේක්ෂා කරන හෙයින්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගම්වල ප්‍රාග්ධන කොටස්වල ආයෝජනය කිරීමට සහ ශ්‍රී

ලංකාවෙන් පිටත ව්‍යාපාර ස්ථාන පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට අවසර ලබාදීමට තීරණය කර ඇත. මෙම ක්‍රියාමාර්ගය තුළින් දේශීය ආයෝජකයන්ට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ හා ඒකාබද්ධ වීමට අවස්ථාව ලැබෙනු ඇතැයි විශ්වාස කෙරේ.

9. **රක්ෂණ සමාගම්වලට ඔවුන්ගේ වත්කම්වලින් කොටසක් එතෙර ආයෝජනය කිරීමට අවසර ලබාදීම.**

දිගුකාලීන අරමුදලින් සහ තාක්ෂණික සංචිතවලින් 20% දක්වා ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීමට රක්ෂකයන්ට අවසර ලබාදෙමින් රක්ෂණ කර්මාන්ත පනත යටතේ නිකුත් කල නියමයන් යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රෙගුලාසි නිකුත් කර ඇත. මෙම අරමුදල් පිටරට ආයෝජනය කිරීමේ ක්‍රියාවලියට පසුකම් සැලසීම පිණිස විනිමය පාලන පනත යටතේ දැන් අවසරය ප්‍රදානය කර ඇත. මෙමගින් රක්ෂකයන්ට ඔවුන්ගේ ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමට අවස්ථාවක් සහ ඔවුන්ගේ සමාගම්වල දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීමට දායකත්වය ලබාදෙනු ඇත. ඒ අනුව, පොදු සංචිත සහ තාක්ෂණික සංචිතවලින් 20% දක්වා උපරිමයකට යටත්ව අවුරුදු 3 කට වඩා වැඩි කාලපරිච්ඡේදයක් සඳහා ආයෝජනය කිරීමට රක්ෂණ සමාගම්වලට අවසර ලබාදෙනු ඇත. මෙම අවසරය යටතේ, එකී අරමුණ සඳහා වාණිජ බැංකුවක ආරම්භ කරන ලද විශේෂ ගිණුමක් හරහා ඔවුන්ගේ ආයෝජන සිදු කළ යුතුය.

මෙකී නියාමන වෙනස්කම් සමඟ, ආයෝජන කටයුතු සම්බන්ධ ප්‍රතිමුඛ සහ ආමුඛ විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම පිණිස ශ්‍රී ලාංකික ආයෝජකයින්ට ප්‍රතිමුඛ ප්‍රේෂණ ආයෝජන ගිණුම (OIA) ආරම්භ කිරීමට අවසර ලැබෙනු ඇති අතර විදේශීය ආයෝජකයින්ට ආමුඛ ප්‍රේෂණ ආයෝජන ගිණුම (IIA) ආරම්භ කිරීමට අවසර ලබාදෙනු ඇත.

ඉහත විදේශ විනිමය පාලන ලිහිල් කිරීම් තුළින් ආයෝජකයින්ගේ විශ්වාසය තවදුරටත් වැඩි දියුණු වීම, දිගුකාලීනව විදේශ සංචිත ශක්තිමත් කිරීම, ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය විදේශ ආයතන සමග හිතෛෂී සම්බන්ධතාවයන් පවත්වා ගැනීම සහ විදේශ විනිමය වෙළෙඳපොළ තහවුරුවීම තුළින් ගෝලීය ආර්ථිකය සමග ශ්‍රී ලාංකීය ආර්ථිකය තවදුරටත් ඒකාබද්ධවීම සඳහා අවශ්‍ය මාර්ගය සකස් වනු ඇතැයි යන්න ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි.

## 3. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2008, 2009 සහ 2010

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | 216.9 | 2.8 | -0.1 | 0.2 | 21.6 | 7.6 | 6.9 | 17.0 | 20.3 | 3.1 |
| මාර්තු | 191.9 | 202.0 | 214.8 | 1.7 | -0.4 | -1.0 | 23.8 | 5.3 | 6.3 | 17.7 | 18.6 | 3.2 |
| අප්‍රේල් | 195.4 | 201.0 | 212.6 | 1.8 | -0.5 | -1.0 | 25.0 | 2.9 | 5.8 | 18.7 | 16.7 | 3.4 |
| මැයි | 198.5 | 205.1 | 215.9 | 1.6 | 2.0 | 1.6 | 26.2 | 3.3 | 5.3 | 19.8 | 14.7 | 3.6 |
| ජූනි | 205.9 | 207.8 | 217.7 | 3.7 | 1.3 | 0.8 | 28.2 | 0.9 | 4.8 | 21.0 | 12.5 | 3.9 |
| ජූලි | 206.4 | 208.7 | 217.6 | 0.2 | 0.4 | 0.0 | 26.6 | 1.1 | 4.3 | 21.9 | 10.4 | 4.2 |
| අගෝස්තු | 206.3 | 208.1 | 218.6 | 0.0 | -0.3 | 0.5 | 24.9 | 0.9 | 5.0 | 22.6 | 8.5 | 4.5 |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | 220.7 | 0.4 | 0.2 | 1.0 | 24.3 | 0.7 | 5.8 | 23.2 | 6.6 | 5.0 |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | 223.3 | -0.3 | 0.4 | 1.2 | 20.2 | 1.4 | 6.6 | 23.4 | 5.2 | 5.4 |
| නොවැම්බර් | 205.2 | 211.0 | 228.5 | -0.7 | 0.8 | 1.1 | 16.3 | 2.8 | 7.0 | 23.0 | 4.1 | 5.8 |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව